# බෞද්ධ දේව සංකල්පයෙන් පිළිබිඹුවන දේව ස්වභාවයන් පිළිබඳ අධ්‍යයනයක්

**හඳුන්ගමුවේ සද්ධතිස්ස හිමි**[1]

## හැඳින්වීම

ලොව බොහෝ ආගම් නිර්මාණය වී ඇත්තේ දේවවාදය පදනම් කරගෙන ය. ආගමේ කේන්ද්‍රය දෙවියන් වහන්සේ වන අතර දෙවියන්ගෙන් තොර විමුක්තියක් ද නො වීය. ලෝක නිර්මාපක සර්ව බලධාරී දේව සංකල්පය බැහැර කරන බුදුන්වහන්සේ පටිච්චසමුප්පාදය මත ගොඩ නැගුණු යථාර්ථවාදී දහමක් දේශනා කළ සේක. බුදුසමය පහළ වූ අවධියේ මුල් බැස තිබූ නිර්මාණවාදී සංකල්ප එම යථාර්ථවාදී දර්ශනය හමුවේ අභියෝගයට ලක් විය. බුදුන්වහන්සේ එතෙක් පැවති දේවවාදය අර්ථශූන්‍ය යැයි දේශනා කරනු ලැබුවේ ආනුභවික චින්තනය පදනම් කරගෙන ය. එහෙත් බුදුසමය දේව නමින් ගැනෙන සත්ව කොට්ඨාසයක පැවැත්මක් දේශනා කර ඇත.

බුදුසමයේ ඉගැන්වෙන දෙවියන් යනු අතීන්ද්‍රිය ග්‍රාහ්‍ය වන බැවින් පියවි ඇසට නො පෙනේ. පුහුදුන් පියවි ඇසෙට නො පෙනෙන බොහෝ දෑ ත්‍රිවිද්‍යාදී අධිමානසික ශක්තීන් උපදවා ගත් බුදු, පසේබුදු, මහරහත් උතුමන් වහන්සේලාට දැකිය හැකි ය. ඉන්ද්‍රිය විෂයානුබද්ධයන් හැඳින්වීමට භාවිත පුද්ගල, සත්ව, ජීව වැනි පද දෙවියන් උදෙසා භාවිත කිරීම උචිත නොවේ.

පුද්ගල විමුක්ති සාධනය උදෙසා යථාර්ථවාදී දහමක් වූ බුදුසමය වටා එක් වූ පිරිස් විවිධ නම්වලින් හැඳින් වූ අතර දේව යන නාමයෙන් ගැනෙන පිරිසක් උදෙසා දේශිත දේශනාවන් බොහෝමයක් ත්‍රිපිටකයේ දක්නට ලැබේ. දෙවියන් පිළිබඳ අදහස් බෞද්ධ සාහිත්‍යයේ ද බොහෝ දුරට දැකිය හැකි ය. ජාතක කථාවල දී බුද්ධ චරිතය හා බැඳුණු වෘත්තාන්ත රාශියක් ඇත. එසේ ම යම් යම් අවස්ථාවල දී දෙවියන් පවා බුදුන් හමුවට පැමිණ මතු වූ ප්‍රශ්න නිරාකරණය කරගත් අවස්ථා කොතෙකුත් ඇත. සංයුත්ත නිකායේ දේවතා සංයුක්තය හා දේවපුත්ත සංයුක්තය දෙස බැලීමේ දී ඒ බව මනා ව වැටහේ. මෙහි දේවතා යනුවෙන් හඳුන්වන පිරිස් නම්වලින් යුක්ත නොවන බවත් දේවපුත්ත යනු නම්වලින් ව්‍යවහාර කෙරෙන පිරිස් බව අටුවාව විස්තර කරයි.

බෞද්ධ දේව සංකල්පයෙන් පිළිබිඹුවන දේව ස්වභාවයන් මොනවා දැයි හඳුනා ගැනීමේ දී දෙවියන්ට දිගු කළ අතක් වක් කිරීමට, වක් වූ අතක් දිගු කිරීමට ගතවන කාලය තරම් ක්ෂණයකින් සක්වල සිට බුදුරදුන් හමුවට පැමිණිය හැකි බව සඳහන් වේ. එමෙන් ම ඉතා සීමිත භූමි ප්‍රදේශයක ලක්ෂ සංඛ්‍යාත දේවතා සමූහයාට ඒකරාශි වීමේ හැකියාව ද පවතී. දේවත්වය ලැබීමට මනුලොව සිදු කළ පුණ්‍යකර්ම හේතුවන අතර පුණ්‍යකර්මයාගේ ස්වරූපය අනුව සැප විපාක ලැබේ. දේවත්වයට පත් වීම, දෙවියන් පිළිබඳ විශ්වාසය ලෝකෝත්තර ප්‍රතිපදාවට අනුකූල නොවන අතර එය ලෞකික විෂයානුබද්ධ වූවකි.

1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය. saddhathissa592@gmail.com

දෙවියන් හා සම්බන්ධ සූත්‍ර සියල්ලම ඇසුරු කිරීම දුෂ්කර කටයුත්තක් වන බැවින් සූත්‍ර කිහිපයක් පමණක් හා පාලි අට්ඨකථාව ද පිරික්සීමෙන් බුදුසමයේ ඉගැන්වෙන දෙවිවරුන්ගේ ස්වභාවයන් කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය. මීට අමතර ව අන්‍ය සමයන්හි ඉගැන්වෙන දේවවාදයන් සමඟ විශ්ලේෂණය කිරීම බෞද්ධ දේව සංකල්පයේ සුවිශේෂි බව හඳුනාගැනීමට හැකිවේ. දෙවියන් පිළිබඳ බුදුන්වහන්සේගේ දේශනා අධ්‍යයනය කිරීමෙන් දෙවිවරුන්ගේ ස්වභාවයන් හඳුනා ගැනීමට හැකිවේ. බුදුසමයට අනුව දේවත්වයට පත්වීම හා දේවත්වයෙන් චුතවීම හේතු-ඵල න්‍යාය අනුව සිදුවන අතර දේව සැපසම්පත් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයෙන් යුක්ත බව වටහා ගත හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

දෙවියන්ගේ ස්වභාවය ගවේෂණය කිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ත්‍රිපිටකයේ දෙවිවරු සම්බන්ධ සූත්‍ර හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. දෙවිවරු පිළිබඳ බුදුසමයේ ස්ථාවරය එම සූත්‍ර දේශනා තුළින් හඳුනා ගත හැකි ය. බුදුන් වහන්සේ හා දෙවියන් සම්බන්ධ විවිධ සූත්‍ර දේශනා ඇතුළත් වුව ද දෙවිවරුන්ගේ ස්වභාවය විස්තර වන සූත්‍ර දේශනා මෙහි දී ඉතා වැදගත් වේ. ඇතැම් සූත්‍ර දේශනාවල දෙවියන්ගේ ස්වභාවයන් සමාන ලක්ෂණ ඇතිව ද ඇතැම් සූත්‍ර දේශනාවල දෙවියන්ගේ ස්වභාවයන් අසමාන ලක්ෂණ ඇතිව ද සඳහන් වේ. ත්‍රිපිටකයේ ඇතැම් සූත්‍ර නාම දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ එම සූත්‍ර නම් කර ඇත්තේ සූත්‍ර අන්තර්ගතයට සම්බන්ධ දේවතාවගේ හෝ දේවතාවියගේ නමින් ය. මෙසේ දෙවිවරුන්ගේ ස්වභාවයන් අනාවරණය වන සූත්‍ර දේශනා තෝරා ගැනීම තත් ප්‍රස්තුතය විසඳා ගැනීමට අතිශයෝපකාරී වේ.

පාලි අට්ඨකථා සාහිත්‍යය ද දෙවියන්ගේ ස්වභාවයන් හඳුනා ගැනීමට උපකාරී වේ. ඒ ඒ සූත්‍ර දේශනාවලට සම්බන්ධ කරුණු ඉදිරිපත් කිරීමේ දී අටුවාචාරීන් වහන්සේලා දෙවිවරුන්ගේ ස්වභාවය සම්බන්ධව බොහෝ තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ අනුව තත් වස්තු විෂයෙහි ඇති විවිධ මූලාශ්‍රය පරිශීලනය කරමින් සමයාන්තර දර්ශනයන් හා ගලපමින් විචාරාත්මකව සහ විමර්ශනාත්මකව අධ්‍යනයක යෙදී ඇත.

**සාකච්ඡාව**

බුදුසමය නිර්මාණවාදී සංකල්ප බැහැර කළ අතර පුද්ගල විමුක්තිය සලසා ගත හැක්කේ බාහිර බලවේගයක උපකාරයෙන් නොව බඹයක් පමණ වූ තම ශරීරයෙන් ම බව අවධාරණය කර ඇත. පුද්ගල විමුක්ති සාධනය උදෙසා ඇති ක්‍රියා පටිපදාව කුසල් දහම් ය. එය වැඩිදියුණු කිරීම ලෝකොත්තර වූ නිර්වාණාවබෝධයට හේතු වේ. බුදුසමයේ පින යනුවෙන් විස්තරවන දන්පිංකම් සිදු කිරීමෙන් උපදවාගනු ලබන ආනිශංසදායී බලවේග යක් ද ඇත. එම පින පක්ෂය වර්ධනය කර ගැනීම ලෞකික වූ සැපසම්පත් උදකර ගැනීමට හේතු වේ. මනුලොව සත්ත්වයන් මිය පරලොව ගොස් උපදින ස්ථාන අතර සැපසම්පත්වලින් යුක්ත දෙව්ලොව උපත ලැබීම දේවත්‍වයට පත්වීමයි. එසේ දෙව්ලොව ඉපදීමට හේතු වන්නේ මනුලොව සිදු කළ පුණ්‍යකර්මයි. පුණ්‍යකර්මයාගේ ප්‍රබලතාව අනුව විවිධ සැපසම්පත්වලින් අනූන දේවලෝකවල උප්පත්තිය ලබයි. තත් සමාජය දෙවියන් සම්මුතියක් වශයෙන් පිළිගෙන තිබුණ ද බුදුන්වහන්සේ සමාජ සම්මතයෙන් එහා ගිය සර්වඥතා ඥානාවබෝධයෙන් ප්‍රත්‍යක්ෂ කොට දෙවියන් සිටින බවත් ඔවුන් හා සාකච්ඡා කළ අයුරුත් ඇතැම් සූත්‍ර දේශනාවලින් පැහැදිලි වේ.

බුදුසමයේ දෙවිවරු ඕපපාතික ව උපදිති. වෙනත් සමයන්හි දෙවිවරුන්ගේ උපතක් නො පිළිගැනෙන අතර බුදුසමය දෙවිවරුන්ගේ උපත හේතු-ඵල සම්බන්ධය අනුව සිදු වන චුති-පටිසන්ධි ක්‍රියාවලියක් ලෙස දක්වයි. බුදුදහමට අනුව නරක, තිරිසන්, ප්‍රේත, අසුර මනුෂ්‍ය ආදි කිනම් භවයක හෝ සිටින අයෙකු කර්මානුරූප දේවත්වයට පත් විය හැකි අතර දේවත්වයේ සිටින්නෙක් කර්මානුරූප ව පහත් යෝනිවල ඉපදේ. වෙනත් ආගම්වල එබඳු අදහසක් නො පිළිගැනේ. සියලු දේවවාදී ආගම් ලෝක නිර්මාපක සර්ව බලධාරී දෙවියෙකු පිළිගනී එහෙත් බුදුදහම එය සපුරා බැහැර කරයි. වෙනත් ආගම්වල ශුද්ධ වූ එක ම දිව්‍ය ලෝකයක් ගැන කථා කරතත්, බුදුදහම දෙව්ලෝ සයක් පමණක් නොව සහස්සී චූලනිකා ලෝක ධාතුවක දිව්‍යලෝක බ්‍රාහ්මලෝක දස දහස් ගණනක් පෙන්වා දී ඇත.

සෑම දේවවාදී ආගමක ම දෙවියා මිනිසාට ඉහළින් සිටී. බුදුදහමෙහි දෙවියා මිනිසාගේ පින්වලින් යැපෙන්නෙකි. ශ්‍රේෂ්ඨ වන්නේ මනුෂ්‍යයා ය. බුද්ධත්වය, මාර්ගඵල ලැබීම දේවත්වය ඉක්ම වූ තත්වයන්ය. වෙනත් ආගම්වල දේවත්වයට ඉහළ පුද්ගලයෙක් නොවේ. බුදුදහම අනුව ශක්‍ර, බ්‍රහ්ම, අසුර ආදි සත්ව කොට්ඨාස පමණක් නොව මාර, යම, නිරයපාල වැනි පාපීහු ද දේව සංඛ්‍යාවට අයත් වේ. බුදුසමය මෙම ලෞකික සැපයට වඩා ලෝකෝත්තර සුවය අගය කරයි.

**සමාලෝචනය**

බුදුදහමේ මූලික අරමුණ වන්නේ සත්වයා සසර දුකින් එතෙර කරවීමයි. ඒ සඳහා බුදුදහම තුළ මාර්ග දර්ශනයක් පෙන්වා දී ඇත. බුදුසමයේ පරම නිෂ්ඨාව නිර්වාණාවබෝධයයි. ඒ තුළ දේවත්‍වයට පත් වීමක් සිදු නොවේ. දේවත්වයට පත්වීම සසර දුකින් එතෙර වීම නොවේ. බුද්ධත්‍වය, මාර්ගඵල ලැබීම දේවත්වය ඉක්ම වූ තත්ත්වයන් ය. දෙවිවරුන් කිසියම් ශක්‍යතාවයකින් හෙබි පිරිසක් වන අතර දෙවිවරුන්ගේ උපත හේතු-ඵල සම්බන්ධය අනුව සිදුවන චුති පටිසන්ධි ක්‍රියාවලියක් ලෙස බුදුසමය පෙන්වා දී ඇත. ඒ අනුව දේවත්වයට පත් වීම තාවකාලික ලෞකික සැපයක් ලැබීමකි. දෙවිවරු සැපසම්පත් ලබන්නේ කර්මානුරූපවය. ඒ නිසා සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වේ. බුදුදහමේ මිනිසා දෙවියාට ඉහළින් සිටී. දෙවිවරුන් මිනිසුන්ගේ පින්වලින් යැපෙන සත්ව කොට්ඨාශයකි. දෙවිවරුන් ද සසර පුරුදු අත් නොහරින අතර දෙවියන්ගේ ශරීර නිර්මාණය වී ඇත්තේ සතර මහාභූතයන්ගේ අති සියුම් අංශුවලිනි. ඒ අනුව දෙවියන් පුද්ගල විශේෂයකට වඩා විශ්ව ශක්ති විශේෂයක් ලෙස සැලකිය හැකි ය.

**මුඛ්‍ය පදඃ** දිව්‍යලෝක, දේව, නිර්මාණවාදය, බුදුසමය, සංකල්පය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය*, චතුක්ක නිපාතො. (2004). රෝහිත සූත්‍රය. නැදිමාලඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය*, සීලක්ඛන්ධවග්ගෝ. (2004). කෙවඩ්ඪ සූත්‍රය. නැදිමාලඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝ නිකාය*, සීලක්ඛන්ධවග්ගෝ. (2004). තෙවිජ්ජ සූත්‍රය. නැදිමාලඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය*, මජ්ඣිම පණ්ණාසකය. (2004). කණ්ණකත්ථල සූත්‍රය. නැදිමාලඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය*, මජ්ඣිම පණ්ණාසකය. (2004). සංගාරව සූත්‍රය. නැදිමාලඃ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.